

වෘත්තිකයන්ගේ සන්නිවේදන අනුකෘතිය
ඇසුරින් දෙමව්පියන් සඳහා සකස් කරන ලද
සන්නිවේදන අනුකෘතියේ සිංහල අනුවර්තනය.



# සන්නිවේදන අනුකෘතිය



දෙමව්පියන් සඳහා විශේෂයෙන්




**කතෘ පිළිබඳව,**

ආචාර්ය චැරිටි රෝලන්ඩ් මහත්මිය පෝර්ට්ලන්ඩ්හි ඔරිගොන් සෞඛ්‍යය හා විද්‍යාව පිළිබඳ විශ්ව විද්‍යාලයේ ආබාධ සහ සංවර්ධනය පිළිබඳ අධ්‍යයන ආයතනයට සම්බන්ධව ක්‍රියාකරයි. ඇය විසින් සංකීර්ණ සහ බහුවිධ ආබාධ සහිත පුද්ගලයන්ගේ සන්නිවේදන කුසලතා සංවර්ධනයට අදාළ පුළුල් පර්යේෂණ සහ නිරූපණ ව්‍යාපෘති රැසක් සංවිධානය කර ඇත.

## සන්නිවේදන අනුකෘතිය(කමියුනිකේශන් මෙට්‍රික්ස් ) යනු කුමක්ද?

සන්නිවේදන අනුකෘතිය(කමියුනිකේශන් මෙට්‍රික්ස් ) සැලසුම් කර ඇත්තේ ඔබේ දරුවා දැන් සන්නිවේදනය කරන්නේ කෙසේද? යන්න දෙමව්පියන් වන ඔබට පෙන්වීමට ය. එය ඔබේ දරුවා සඳහා තාර්කිකව සන්නිවේදනය දියුණු කළ යුතු ආකාරය පිළිබඳ අදහසක් ද ලබා දෙනු ඇත. එය ප්‍රථම වරට 1990 දී ප්‍රකාශයට පත් කරන ලද අතර 1996 දී ඔරිගන් සෞඛ්‍ය හා විද්‍යා විශ්ව විද්‍යාලයේ ආචාර්ය චැරිටි රෝලන්ඩ් විසින් සංශෝධනය කරන ලදී.

මෙහි මුල් ඇගයුම කථන භාෂා හා භාශා චිකිත්සකවරුන් සහ අධ්‍යාපන විශේෂඥන් සඳහා භාවිතා කිරීම සඳහා නිර්මාණය කර ඇත: එය තවමත් [www.designtolearn.com](http://www.designtolearn.com) හරහා ලබා ගත හැකිය.දෙමව්පියන් සඳහා සකස් කරන ලද මෙම ඇගයුම වඩාත් භාවිතා කිරීමට පහසු ලෙස භාවිතා කිරීමට නිර්මාණය කර ඇත. එමෙන්ම, ඇගයුමේ ප්‍රතිඵල පැතිකඩක (profile) තනි පිටුවක් ලෙස සාරාංශ කිරීමට හැකි ලෙස සකසා ඇත. පැතිකඩ යනු ඔබේ දරුවා භාවිතා කරන සන්නිවේදන හැසිරීම් මට්ටම සහ ඔහු හෝ ඇය ප්‍රකාශ කරන පණිවිඩ මොනවාද යන්න බැලූ බැල්මට පෙන්වන සටහනකි . මෙම පැතිකඩ හරියටම මැට්‍රික්ස් හි මුල් නිර්මාණයේ පැතිකඩට සමාන වේ. නිවසේදී සහ පාසැලේදී දරුවෙකු සන්නිවේදනය කරන ආකාරය එකිනෙකාට පෙන්වීමට දෙමාපියන්ට සහ වෘත්තිකයන්ට (කථන භාෂා හා භාශා චිකිත්සකවරුන් සහ අධ්‍යාපන විශේෂඥන්) එකම ඇගයුමක් භාවිතා කළ හැකි බව මින් අදහස් වේ.



## ඉලක්කගත පිරිස

සන්නිවේදනයේ මුල් අවධියේ සිටින සියලුම වයස්වල දරුවන් සඳහා සන්නිවේදන අනුකෘතිය(කමියුනිකේශන් මේට්‍රික්ස් ) සුදුසු වේ. සාමාන්‍ය වර්ධන රටාවක් සහිත දරුවකු තුළ මැට්‍රික්ස් මගින් ආවරණය වන සන්නිවේදන කුසලතා පරාසය වයස මාස 0 ත් 24 ත් අතර වේ. ඕනෑම ආකාරයක සහ ප්‍රමාණයක සංකීර්ණ හා බහුවිධ ආබාධ සහිත දරුවෙකු සඳහා මෙය සුදුසු වේ. දැනටමත් යම් භාෂාවක් භාවිතා කරමින් තේරුමක් සහිතව සහ ගලායාමක් සහිතව සන්නිවේදනය කරන දරුවෙකුට සන්නිවේදන අනුකෘතිය සුදුසු නොවේ.

මෙට්‍රික්ස් හි ඕනෑම ආකාරයක සන්නිවේදන හැසිරීමක් ඇතුළත් වේ:

-පින්තූර පද්ධති, ඉලෙක්ට්‍රොනික උපකරණ, ශබ්ධ ප්‍රතිචාර ලෙස ලබාදෙන පද්ධති, බ්‍රේල්, සංඥා භාෂාව සහ වස්තු සංකේත වැනි සන්නිවේදන ක්‍රමවල විකල්ප සන්නිවේදන (AAC) ආකාර.

-සරල ඉඟි, ශරීර චලනයන්, ශබ්ධ, ඇස් බැල්ම, මුහුණේ ඉරියව් වැනි පූර්ව සංකේත යොදාගෙන කරන සන්නිවේදනය.

## සන්නිවේදන අනුකෘතියේ සැලසුම

සන්නිවේදන අනුකෘතිය(කමියුනිකේශන් මේට්‍රික්ස් ) නිර්මාණය කිරීමේදී, සාමාන්‍ය වර්ධන රටාව අනුව වර්ධනය වන ළදරුවන් නව දෙනෙකුගේ ලබාගත් විස්තර යොදාගෙන ඇති අතර ඔවුන් මාස 6 ත් 20 ත් අතර තුන් වරක් ඇගයුම්වලට ලක්කර මෙම විස්තර ලබාගෙන ඇත. සන්නිවේදනයේ ප්‍රධාන අංශ දෙකක් මෙම අනුකෘතියට සම්බන්ධ කරගෙන ඇත. ඒවානම්, මිනිසුන් සන්නිවේදනය කිරීමට හේතු සහ සන්නිවේදනය සඳහා මිනිසුන් භාවිතා කරන හැසිරීම්.

**සන්නිවේදනය කිරීමට හේතු හතරක් තිබේ.**

පැතිකවඩහි ඇති තීරුවලට පහළින් පෙනෙන්නට තිබෙන පරිදි, සන්නිවේදනය කිරීමට අවශය වන ප්‍රධාන හේතු හතරක් යොදාගෙන මෙම අනුකෘතිය (මේට්‍රික්ස්) නිර්මාණය කර ඇත. අපිට අවශය නොවන දේ ප්‍රතික්ශේප කිරීමට, අපිට අවශය දේ ලබාගැනීමට, සමාජය සමඟ සම්බන්ධ වීමට, තොරතුරු ලබාදීමට හෝ දැනගැනීමට එම හේතු හතර වේ. .මෙම එක් එක් ප්‍රධාන හේතු හතර යටවත් මිනිසුන් සන්නිවේදනය කරන විශේෂිත පණිවිඩ ඇත.මේවා අනුකෘතිය (මේට්‍රික්ස්) සම්පූර්ණ කරන විට ඔබ පිළිතුරු දිය යුතු ප්‍රශ්න වලටම අනුරූප වේ.

**එම විශේෂිත පණිවිඩ වන්නේ:**

**1.ප්‍රතික්ෂේප කිරීම.**

අපහසුතාවය ප්‍රකාශ කිරීම.

විරෝධය ප්‍රකාශ කිරීම.

යම් කිසි දෙයක් ප්‍රතික්ශේප කිරීම.

**2. ලබාගැනීම.**

සුව පහසුව ප්‍රකාශ කිරීම.

යම් ක්‍රියාවක් නොනවත්වා සිදුකිරීම.

යම් දෙයක් තවත් ලබාගැනීම.

යම්කිසි ක්‍රියාවක් තව දුරටත් / නැවත නැවත ඉල්ලීම

අලුත් ක්‍රියාවක් කිරීමට ඉල්ලීම

භාණ්ඩයක් නැවත ඉල්ලීම.

දේවල් අතරින් තේරීම

අලුත් භාණ්ඩයක් ඉල්ලීම

ළඟ නොමැති භාණ්ඩයක් ඉල්ලීම

**3. සමාජීය**

අන් අය කෙරෙහි ඇති උනන්දුව ප්‍රකාශ කිරීම.

අවධානය ලබා ගැනීම.

අවධානය ඉල්ලීම

සෙනෙහස දැක්වීම

ආචාර කිරීම

දේවල් බෙදා ගැනීම.

කෙනෙකුගේ අවධානය වෙන යමක් වෙත යොමු කිරීම.

ආචාරශීලී වචන භාවිතය

**4. තොරතුරු**

ඔව් , නෑ ප්‍රශ්නවලට පිලිතුරු දීම.

ප්‍රශ්න ඇසීම.

දේවල් හෝ පුද්ගලයින් නම් කිරීම.

අදහස් දැක්වීම.

**සන්නිවේදනයේ මට්ටම් හතක් තිබේ.**

පැතිකඩෙහි (profile) පේළි හත මගින් නිරූපණය කෙරෙන සන්නිවේදන හැසිරීම් මට්ටම් හතකට ඇගයුම තුල ද තවදුරටත් සංවිධානය කර ඇත.

**මෙම මට්ටම් හත වන්නේ :**

### I. දරුවා අරමුණකින් යුතුව හැසිරීමට පෙර අවධිය.

දරුවාගේ හැසිරීම ඔහුගේ පාලනය යටතේ නැත - නමුත් එය ඔහුගේ සාමාන්‍ය තත්වය පෙන්නුම් කරයි (බඩගිනි හෝ මුත්‍රා කිරීම හෝ නිදිමත වැනි). ශරීරයේ චලනයන්, මුහුණේ ඉරියව් සහ ශබ්ධ වැනි සාමාන්‍ය හැසිරීම් වලින් දෙමව්පියන්ට දරුවාගේ තත්ත්වය කුමක්ද යන්න කීමට හැකිය.

### II. දරුවා අරමුණකින් යුතුව හැසිරෙන අවධිය.

දරුවා හැසිරීම දැන් අරමුණකින් යුතුවේ.(හැසිරීම දරුවාගේ පාලනය යටතේ සිදුවේ.) නමුත් "මම මෙය කරන්නේ නම්, අම්මා හෝ තාත්තා මා වෙනුවෙන් එය කරනු ඇත" යන්න දරුවාට තවමත් නොවැටහේ. වෙනත් වචන වලින් කිවහොත් ඔහු / ඇය තවමත් අරමුණකින් යුතුව සන්නිවේදනය නොකරයි. ශරීරයේ චලනයන්, මුහුණේ ඉරියව්, කටහඬ සහ ඇස්වල බැල්ම වැනි දරුවාගේ හැසිරීම් මගින් දෙමව්පියන්ට දරුවාගේ අවශ්‍යතා සහ කැමති දේ කුමක්දැයි කීමට හැක.

දරුවාගේ අරමුණකින් යුතුව සන්නිවේදනය කිරීම III වන අදියර සමඟ ආරම්භ වේ.

### III. සාම්ප්‍රදායික නොවන සන්නිවේදනය

දරුවා තම අවශ්‍යතා සහ තමන් කැමති දේ අන් අයට ප්‍රකාශ කිරීමට හිතාමතාම පූර්ව සංකේතාත්මක හැසිරීම් භාවිතා කරයි. සන්නිවේදනය සඳහා භාවිතා කරන හැසිරීම් පූර්ව සංකේතාත්මක වන්නේ ඒවා කිසිදු ආකාරයක සංකේතයකට සම්බන්ධ නොවන බැවිනි. දරුවා වයසෙන් වැඩිවන විට ඒවා භාවිතා කිරීම සමාජය තුල සන්නිවේදනයේදී පිළිගත නොහැකි නිසා ඒවා "සාම්ප්‍රදායික නොවන" ලෙස හැඳින්වේ: මේ යටතට ශරීර චලනයන්, කටහඬ, මුහුණේ ඉරියව් සහ සරල ඉඟි ඇතුළත් වේ.

### IV. සාම්ප්‍රදායික සන්නිවේදනය

දරුවා තම අවශ්‍යතා සහ කැමති දේ අන් අයට ප්‍රකාශ කිරීමට හිතාමතාම පූර්ව සංකේතාත්මක හැසිරීම් භාවිතා කරයි. සන්නිවේදනය සඳහා භාවිතා කරන හැසිරීම් පූර්ව සංකේතාත්මක වන්නේ ඒවා කිසිදු ආකාරයක සංකේතයකට සම්බන්ධ නොවන බැවිනි. ''සාම්ප්‍රදායික'' ඉඟි යටතට "ඔව්" යන්න පැවසීමට ඔලුව වැනීම, ඇඟිල්ල දිගුකර යම් දෙයක් පෙන්වීම වැනි හැසිරීම් ඇතුළත් වේ. මෙම ඉඟිවල තේරුම් තීරණය වන්නේ ඒවා භාවිතා කරන දරුවා සිටින සංස්කෘතික වටපිටාව අනුවය.

වැඩිහිටියන් වන අපද, මෙම සාම්ප්‍රදායික ඉඟි භාෂාව සමග භාවිතා කරයි. මෙවැනි බොහෝ ඉඟි (ප්‍රධාන ලෙස ඇඟිල්ල දිගු කර පෙන්වීම වැනි) සිදුකිරීමට පෙනීමේ හැකියාව හොඳින් පැවතිය යුතු අතර සංකීර්ණ දෘශ්‍යාබාධ සහිත දරුවන් සඳහා මෙම සන්නිවේදන ක්‍රම සුදුසු නොවනු ඇත.

සංකේතාත්මක සන්නිවේදන V වන අදියර සමඟ ආරම්භ වේ.

## V. භෞතික සංකේත /Concrete symbols

දරුවා අප දකින භෞතික සංකේත භාවිතා කරන්නේ ඔවුන් නිරූපණය කරන දේ දරුවාට පැහැදිලිව පෙනෙන ආකාරයටය. ඒවා පෙනෙන්නේ, දැනෙන්නේ, චලනය වන්නේ හෝ ඔවුන්ට සන්නිවේදනය කිරීමට අවශ්‍ය දේට සමානවය.පින්තූර සංකේත, වස්තු සංකේත (උදා: ''සපත්තුව'' නිරූපණය කිරීමට සපත්තු ලේස් එකක් වැනි), ඇතැම් නිරූපනය කරන ඉඟි (උදා:''වාඩි වන්න' 'යැයි පැවසීමට පුටුවකට තට්ටු කිරීම වැනි) සහ ශබ්ධ (උදා:මී මැස්සෙකුගේ ශබ්ධය වැනි ශබ්ධ නැඟීමක් මී මැස්සෙකුට ආදේශ කිරීම) වැනි දේ භෞතික සංකේතවලට අදාළ වේ.සංකීර්ණ ශාරීරික ආබාධ සහිත දරුවන්ට යාන්ත්‍රික උපකරණයක් භාවිතා කිරීමෙන් හෝ ඇඟිල්ල දිගු කිරීම, ස්පර්ශ කිරීම හෝ ඇස් බැල්ම මගින් පින්තූර සහ වස්තු සංකේත වෙත පිවිසිය හැකිය.

දැනටමත් වියුක්ත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන) සංකේත (VI අදියර) භාවිතා කිරීමට හැකි දරුවන්ට භෞතික සංකේත භාවිතා කිරීමට අවශ්‍ය නොවේ.බොහෝ ළමයින් මෙම අදියර මඟ හරී. කෙසේ වෙතත්, වියුක්ත සංකේත භාවිතා කිරීමට ඉගෙනගෙන නොමැති සමහර දරුවන් සඳහා, භෞතික සංකේත (v වන අදියර) වියුක්ත සංකේත (VI අදියර) භාවිතා කිරීමට උදව්වක් විය හැක.

## VI. වියුක්ත සංකේත/ abstract symbols (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත)

දරුවා කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන වැනි වියුක්ත සංකේත භාවිතා කරයි. මෙම සංකේත ඔවුන් සන්නිවේදනය කිරීමට අවශ්‍ය දේට භෞතිකව සමාන නොවේ. ඒවා ගැලපෙන අයුරින් විවිධ අවස්ථාවලදී භාවිතා වේ.

## VII. භාෂාව

ව්‍යාකරණ නීතිරීතිවලට අනුව, දරුවා සංකේත (ඕනෑම ආකාරයක සංකේත) පිළිවෙලට සකස් කළ සංකේත දෙකක් හෝ තුනක් (උදා:"බීම ඕනේ.", "මාව එළියට ගෙන යන්න") එකතු කරයි. සංකේත පිළිවෙලට සකස් කර ඇති ආකාරය අනුව වචන කාණ්ඩවල අර්ථය වෙනස් විය හැකි බව දරුවා තේරුම් ගනී.

*******

# ආරම්භය.....

පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ඔබගේ දරුවාගේ සන්නිවේදන කුසලතා වඩාත් හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය හඳුනාගන්න.

☐ 01) මගේ දරුවාට තවමත් ඔහුගේ/ඇයගේ සිරුර සම්බන්ධයෙන් කිසිම පාලනයක් නැතිබව පෙනේ. ඔහුට/ඇයට කුමක් හෝ උවමනා බව දැනගන්නා එකම ක්‍රමය වන්නේ ඔහුට හෝ ඇයට අපහසුවක් දැනෙනවිට කරන කලබලය නැත්නම් කෙඳිරිය. එසේම ඔහු/ඇය සතුටෙන් සහ පහසුවෙන් සිනහසීම හෝ සුලු සුලූ ශබ්ධ කරමින් සන්සුන්ව සිටීම සිදුකරයි.

මෙම ප්‍රකාශය ඔබගේ දරුවාට ගැලපේ නම් (අ) කොටස බලන්න (පිටුව 10).

☐ 02) මගේ දරුවාට ඔහුගේ/ඇයගේ හැසිරීම් සම්බන්ධයෙන් පාලනයක් තිබේ. නමුත් ඔහු/ඇය මා සමඟ සන්නිවේදනය කිරීමට ඒවා භාවිතය නොකරයි. ඔහුට/ඇයට යමක් වුවමනා බව පෙන්වීම සදහා ළඟට නොපැමිණේ. නමුත් එවැනි දේ දරුවා තනිව කරගැනීමට යන නිසා ඔහුට/ඇයට අවශ්‍ය දේ හඳුනාගැනීමට පහසුය. දරුවාගේ හැසිරීම ඔහුට/ඇයට අවශ්‍ය කුමක්දැයි මාහට පෙන්වයි. දරුවාට කෑමට කුමක්හෝ නැති වුවහොත් මා හට පවසා කෑම ගෙන්වා ගැනීමෙන් තොරව තනිව එය කරගැනීමට උත්සහ කරයි.

මෙම ප්‍රකාශය ඔබගේ දරුවාට ගැලපේ නම් (ආ) කොටස බලන්න (පිටුව 14).

☐ 03) මගේ දරුවා පැහැදිලිවම ඔහුගේ/ඇයගේ අවශ්‍යතා මා සමඟ සන්නිවේදනය කිරීමට උත්සාහ කරයි. මා ලවා දෙයක් කරගන්නා ආකාරය දරුවා දනී.. ඔහු/ඇය විවිධ ඉඟි සහ ශබ්ධ (ඇඟිල්ල දිගු කර පෙන්වීම, මගේ අතින් ඇදීම, මගේ දිහාත් ඔහුට/ඇයට අවශ්‍ය දේ දිහාත් මාරුවෙන් මාරුවට බැලීම වැනි ඒවා) මා සමඟ සන්නිවේදනය කිරීමට පාවිච්චි කරයි. උදාහරණයක් ලෙස කිරි අවශ්‍ය නම් ඔහුගේ/ඇයගේ කෝප්පය මට දෙයි. එසේ නැතිනම්, ශීතකරණය මට පෙන්වයි. සන්නිවේදනය කිරීමට කිසිදු භාෂාවක් පාවිච්චි නොකරයි.

මෙම ප්‍රකාශය ඔබගේ දරුවාට ගැලපේ නම් (ඇ) කොටස බලන්න (පිටුව 18).

හෝ

☐ මගේ දරුවා ඔහුට/ඇයට ඕනෑ දේ භාෂා ආකාරයකින් හෝ සංකේත සන්නිවේදනයකින් (කතාව, වචන ලිවීම, බ්‍රේල් ක්‍රමය, සංකේතාත්මක පින්තූර, ත්‍රිමාණ (3D) සංකේත, සංඥා භාෂාව වගේ දේවලින්) අඟවයි. දරුවා සංකේත පාවිච්චි කිරීමේදී ඒවයෙන් කියවෙන දේ පිළිබඳ ඔහුට/ඇයට අවබෝධයක් ඇත.

මෙම ප්‍රකාශය ඔබගේ දරුවාට ගැලපේ නම් (ඇ) කොටස බලන්න (පිටුව 18).

## අ කොටස සඳහා උපදෙස් ...

### ලකුණු ලබා දීම

- ඔබ දකින සෑම ප්‍රශ්නයක්ම ඔබේ දරුවාට විවිධාකාරයෙන් ප්‍රකාශ කළ හැකි පණිවිඩයකට සම්බන්ධය.
- සෑම ප්‍රශ්නයක්ම කියවා විස්තර කර ඇති පණිවිඩය ඔබේ දරුවාට කිව හැකිදැයි තීරණය කරන්න.
- පහත ලැයිස්තුවෙන් එම පණිවිඩය ප්‍රකාශ කිරීමට ඔහු භාවිතා කරන්නේ කුමන හැසිරීම්දැයි පරීක්ෂා කරන්න.
- ඔබ පරීක්ෂා කළ කිසියම් හැසිරීමක් ඔබේ දරුවා දැනටමත් සිදු කරනවාද, නැත්නම් තවමත් ඔබේ දරුවා තුළ දියුණු වෙමින් පවතින අවධියක තිබේද යන්නද ඔබ තීරණය කළ යුතුය.
- ඔබ තවමත් දියුණුවෙමින් පවතින බව සලකන හැසිරීම් වලට යාබදව කොටුව තුළ හරස් ඉරක් [/] යොදන්න.
- දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් වලට යාබදව කොටුව තුළ කතිර ලකුණක් [X] යොදන්න.
- හැසිරීම දියුණු කරගෙන තිබේද නැද්ද යන්න තීරණය කිරීමට පහත අර්ථ දැක්වීම් භාවිතා කරන්න:

**[/] දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම්.**

- මෙම හැසිරීම් ඇතැම් අවස්ථාවල පමණක් සිදුකරයි.
- මෙවැනි හැසිරීම් කිරීමට කවුරුන් හෝ පෙළඹවූ විට හෝ උනන්දු කළ විට පමණක් සිදු කරයි.
- මෙවැනි හැසිරීම් සිදු කරන්නේ අවස්ථා එකක් හෝ දෙකක් හෝ එක් පුද්ගලයෙකු සමඟ පමණි.

**[X] දරුවා දැනටමත් සිදු කරන හැසිරීම්.**

- අවස්ථාවක් ලැබුනු විට බොහෝ විට මෙම හැසිරීම් ස්වාධීනව කරයි.
- මෙය විවිධ අවස්ථා ගණනාවක සහ විවිධ පුද්ගලයින් සමඟ කරයි.

# (අ) කොටස

-මෙම අදියර තුලදී, ඔබගේ දරුවාට ඇයගේ හැසිරීම් පාලනය කරගත නොහැකි නමුත් සංවේදනවලට ප්‍රතිචාර දැක්වීමට හැකිබව පෙනේ.

-දරුවාගේ ප්‍රතිචාරවලින් ඔහුට/ඇයට දැනෙන ආකාරය පෙන්වයි.

## අ. 1 අපහසුතාවය ප්‍රකාශ කිරීම.

-ඔබගේ දරුවාට අපහසුතාවයක් ඇතිබව කිවහැකිද? (වේදනාවකදී, මුත්‍රා කලවිට, බඩගිනි විට, තැතිගත් ආකාරයක් පෙන්වන විට (startle))

-එසේ නම් ඔබේ දරුවා ඔහුට /ඇයට අපහසුතාවයක් ඇති බව ඔබට පෙන්වන්නේ කෙසේද?




### ශරීර චලනය

- ☐ ඉරියව්ව වෙනස් කිරීම (ඇඟ තදකිරීම ,ඇඟ ඇඹරවීම,පැත්තට හැරීම.)
- ☐ අවයව චලනයන් (කකුල් ගැසීම, බාහු නැවීම)
- ☐ හිසේ චලනයන් (හිස ඉවතට හැරවීම )



### මූලික ශබ්ධ

- ☐ හැඬීම, මැසිවිලි නැගීම හෝ කෑගැසීම.



### මුහුණේ ඉරියව්

- ☐ අකමැති බව හැඟවීමට මූහුණ ඇකිලීම.

## අ. 2 සුව පහසුව ප්‍රකාශ කිරීම.

-ඔබගේ දරුවා සැහීමකට පත් වී සුව පහසුවෙන් හෝ උද්යෝගයෙන් සිටින බව ඔබට කිව හැකිද?

-එසේනම් ඔබේ දරුවා සුව පහසුවෙන් සිටිනබව ඔබ සිතන්නේ කෙසේද?




## ශරීර චලනය

- ☐ ඉරියව්ව වෙනස් කිරීම (ඇඟ තදකිරීම , ඇඟ සැහැල්ලු කිරීම.)
- ☐ අවයව චලනයන් (කකුල් ගැසීම, අත් නැවීම)
- ☐ හිසේ චලනයන් (හිස පහතට කිරීම)



## මූලික ශබ්ධ

- ☐ සිහින් ශබ්ධ සිදුකිරීම හෝ උස් හඬින් දිගු වේලාවක් හැඬීම



## මුහුණේ ඉරියව්

- ☐ සිනාසීම
.

## අ.3 අන් අය කෙරෙහි ඇති උනන්දුව ප්‍රකාශ කිරීම.

- ඔබගේ දරුවා අන් අය කෙරෙහි උනන්දුවක් දක්වන බව ඔබට කිව හැකිද?
- එසේනම් ඔබේ දරුවා ඔබ කෙරෙහි හෝ අන් අය කෙරෙහි උනන්දුව දක්වන බව ඔබට කිව හැකිද?



### ශරීර චලනය


☐ ඉරියව්ව වෙනස් කිරීම (ඇඟ තදකිරීම, ඇඟ සැහැල්ලු කිරීම.)

☐ අවයව චලනයන් (කකුල් ගැසීම, බාහු නැවීම)



### මූලික ශබ්ධ

☐ සිහින් ශබ්ධ සිදුකිරීම හෝ ඉතා උනන්දුවෙන් ශබ්ධ කිරීම (fuss).



### මුහුණේ ඉරියව්

☐ සිනාසීම
.

**ඔබගේ දරුවාහට තමා විසින් පාලනය කරගත හැකි, හැසිරීම් එකක් හෝ කිහිපයක් තිබේද? එසේනම් ආ කොටසේ (පිටු අංක 14) ඇති යම් කිසි ප්‍රශ්නයකට ''ඔව්'' පිලිතුර දීමට හැකිදැයි බලන්න. එසේ නොමැතිනම්, පිටු අංක 18 ට (ඇ කොටසට) යන්න.**

# ආ කොටස සඳහා උපදෙස් ...

**ලකුණු කිරීම**

- ඔබ දකින සෑම ප්‍රශ්නයක්ම ඔබේ දරුවාට විවිධාකාරයෙන් ප්‍රකාශ කළ හැකි පණිවිඩයකට සම්බන්ධය.
- සෑම ප්‍රශ්නයක්ම කියවා විස්තර කර ඇති පණිවිඩය ඔබේ දරුවාට කිව හැකිදැයි තීරණය කරන්න.
- පහත ලැයිස්තුවෙන් එම පණිවිඩය ප්‍රකාශ කිරීමට ඔහු භාවිතා කරන්නේ කුමන හැසිරීම්දැයි පරීක්ෂා කරන්න.
- ඔබ පරීක්ෂා කළ කිසියම් හැසිරීමක් ඔබේ දරුවා දැනටමත් සිදු කරනවාද, නැත්නම් තවමත් ඔබේ දරුවා තුළ දියුණු වෙමින් පවතින අවධියක තිබේද යන්නද ඔබ තීරණය කළ යුතුය.
- ඔබ තවමත් දියුණුවෙමින් පවතින බව සලකන හැසිරීම් වලට යාබදව කොටුව තුළ හරස් ඉරක් [/] යොදන්න.
- දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් වලට යාබදව කොටුව තුළ කතිර ලකුණක් [X] යොදන්න.
- හැසිරීම දියුණු කරගෙන තිබේද නැද්ද යන්න තීරණය කිරීමට පහත අර්ථ දැක්වීම් භාවිතා කරන්න:

**[/] දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම්.**

- මෙම හැසිරීම් ඇතැම් අවස්ථාවල පමණක් සිදුකරයි.
- මෙවැනි හැසිරීම් කිරීමට කවුරුන් හෝ පෙළඹවූ විට හෝ උනන්දු කළ විට පමණක් සිදු කරයි.
- මෙවැනි හැසිරීම් සිදු කරන්නේ අවස්ථා එකක් හෝ දෙකක් හෝ එක් පුද්ගලයෙකු සමඟ පමණි.

**[X] දරුවා දැනටමත් සිදු කරන හැසිරීම්.**

- අවස්ථාවක් ලැබුනු විට බොහෝ විට මෙම හැසිරීම් ස්වාධීනව කරයි.
- මෙය විවිධ අවස්ථා ගණනාවක සහ විවිධ පුද්ගලයින් සමඟ කරයි.

# (ආ) කොටස

-මෙම අදියර තුලදී ඔබගේ දරුවාට අරමුණක් සහිතව යම් දෙයක් කල හැකිය.

-නමුත් තවමත්, තමන්ගේ හැසිරීම් තුලින් ඔබ සමග සන්නිවේදනය කලහැකි බව ඔහුට වැටහෙන්නේ නැත.

-උදාහරණයක් වශයෙන් ඔහුට තවත් වැඩිපුර බීමට යමක් අවශ්‍යයි නම්, එය ලබාගැනීමට අඩමින් බිම පෙරලිය හැක.

-නමුත් දරුවා කන් කෙඳිරිගාමින් ඔබ ලවා ඔහුගේ/ඇයගේ බෝතලය ළඟට ගෙන්වා ගැනීමට උත්සහ නොකරයි.

## ආ.1 විරෝධය ප්‍රකාශ කිරීම.

-ඔබගේ දරුවාට යම්කිසි විශේෂ දෙයක්, එනම් යම් ආහාරයක් හෝ සෙල්ලම් බඩුවක් හෝ කිතිකැවීම වැනි ඔබ විසින් කරන කිසියම් සෙල්ලමක් ප්‍රතික්ශේප කරයිද?

-එසේ නම් තමා එය ප්‍රතික්ශේප කරන බව හැගවීමට ඔබගේ දරුවා සිදුකරන්නේ කුමක්ද?




### ශරීර චලනය

- [ ] හිසෙහි චලන (හිස ඉවතට හැරවීම, හිස පිටුපසට ඇදීම)
- [ ] බාහු වල චලන (බාහු නැවීම, අතින් තල්ලු කිරීම, ඉවතට විසිකිරීම)
- [ ] කකුලේ චලන (කකුල් පොලවේ ගැසීම, පයින් ගැසීම)
- [ ] පුද්ගලයාගෙන් හෝ භාණ්ඩයෙන් ඉවතට යාම.



### මූලික ශබ්ධ

- [ ] කන් කෙඳිරි ගෑම, ඉතා උනන්දුවෙන් ශබ්ධ කිරීම., කෑ ගැසීම.



### මුහුණේ ඉරියව්

- [ ] රැවීම, අකමැති බව හැඟවීමට මුහුණ ඇකිලීම

## ආ.2 ක්‍රියාවක් නොනවත්වා සිදුකිරීම.

-සමහර අවස්ථාවලදී ඔබේ දරුවා කරමින් සිටි යම්කිසි ක්‍රියාකාරකමක් නැවැත්වූ පසුවද, නොනවත්වා දිගටම කරගෙන යාමට අවශ්‍ය බව ප්‍රකාශ කරයිද?

- (උදාහරණ ලෙස උඩ පැනීම, සරල සිංදු වලට (nursery rhymes) මව හෝ පියා සමඟ දරුවා තාලයට අත්පුඩි ගැසීම, සෙල්ලම් වාද්‍ය භාණ්ඩයක් වාදනය වැනි ක්‍රියාකාරකමක් කිරීම)


-එසේනම්, එම ක්‍රියාකාරකම නොනවත්වා කරගෙන යාමට අවශ්‍ය බව ඇය/ඔහු ඔබට ප්‍රකාශ කරන්නේ කෙසේද?



### ශරීර චලනය



### මූලික ශබ්ධ




### මුහුණේ ඉරියව්

☐ හිසෙහි චලන (හිස එක් පසකට හැරවීම, හිස පහතට කිරීම)

☐ බාහු වල චලන (බාහු නැවීම)

☐ කකුලේ චලන (පයින් ගැසීම)

☐ සිහින් ශබ්ධ සිදුකිරීම හෝ උස් හඩින් දිගු වේලාවක් හැඩීම හෝ ඉතා උනන්දුවෙන් ශබ්ධ කිරීම.



### දෘෂ්‍ය

☐ කෙනෙකු දෙස බැලීම

☐ සිනාසීම

## ආ.3 යම් දෙයක් තවත් ලබාගැනීම

ඔබගේ දරුවා යම්කිසි විශේෂ දෙයක් තව ලබා ගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කරයිද? (උදාහරණ ලෙස කෑම හෝ සෙල්ලම බඩු)


එසේ නම් ඔබගේ දරුවා එය තවත් අවශ්‍ය බව ප්‍රකාශ කරන්නේ කෙසේද?



### ශරීර චලනය



### මූලික ශබ්ධ



### මුහුණේ ඉරියව්

☐ ලබා ගැනීමට අවශ්‍ය දෙයට ලගාවීම.

☐ හිසෙහි චලන (හිස එක් පසකට හැරවීම, හිස පහතට කිරීම)

☐ බාහු වල චලන (බාහු නැවීම)

☐ සිහින් ශබ්ධ සිදුකිරීම, කෑගැසීම හෝ කන් කෙඳිරි ගෑම.

### දෘෂ්‍ය

☐ අවශ්‍ය දෙය දෙස බැලීම.

☐ සිනාසීම

## ආ.4 අවධානය ලබා ගැනීම.

-අරමුණකින් තොරව වුවද ඔබගේ අවධානය ඔහු හෝ ඇය වෙතට ලබාගැනීමට යම් යම් දේවල් ඔබගේ දරුවා විසින් සිදුකරයිද?

-එසේ නම්, ඔබගේ අවධානය ලබාගැනීමට ඔබගේ දරුවා කරන හැසිරීම් මොනවාද?




### ශරීර චලනය

- ☐ පුද්ගලයා දෙසට ලගාවීම.
- ☐ හිසෙහි චලන (හිස ඉදිරියට චලනය, හිස පහතට කිරීම)
- ☐ බාහු වල චලන (අත් නැවීම)
- ☐ කකුලේ චලන (පයින් ගැසීම)




### මූලික ශබ්ධ

- ☐ සිහින් ශබ්ධ සිදුකිරීම, උස් හඬින් දිගු වේලාවක් හැඞීම හෝ ඉතා උනන්දුවෙන් ශබ්ධ කිරීම.



### දෘෂ්‍ය

- ☐ පුද්ගලයා දෙස බැලීම



### මුහුණේ ඉරියව්

- ☐ සිනාසීම

**ඔබගේ දරුවාට අරමුණක් සහිතව සන්නිවේදනය කිරීමට භාවිතා කරන යම්කිසි හෝ හැසිරීම් තිබේද? එසේනම් ඇ කොටසේ (පිටු අංක 18) ඇති කිසියම් හෝ ප්‍රශ්නයකට ''ඔව්'' පිලිතුර දීමට හැකිදැයි බලන්න.**

## (ඇ) කොටස

- මෙම අවධියේදී ඔබගේ දරුවා විසින් කරන්නාවූ සමහර දේවල් වලට ඔබ විසින් විවිධාකාරවූ ප්‍රතිචාර දක්වන බව දරුවා දනී.
- දරුවා තමාගේ හැසිරීම් අරමුණක් සහිතව සන්නිවේදනය සඳහා භාවිතා කරයි.
- දරුවා අරමුණක් සහිතව සන්නිවේදනය කරන ආකාර කිහිපයක් ඇත.
- සමහර අවස්ථාවලදී කථාව, සංඥා භාෂාව, පිංතූර, ත්‍රිමාන (3D) රූප ආදී සංඥා හෝ සංකේත භාවිතා කරයි.
- අනෙක් අවස්ථාවලදී විශේෂිත ඉඟි හෝ ශරීර චලන සමහර අවස්ථාවලදී මූලික ශබ්ධ භාවිතා කරයි.
- ශාරීරික දුබලතා ඇති සමහර දරුවන් සන්නිවේදනය සඳහා විද්‍යුත් උපකරණ භාවිතා කරයි.
- දරුවා සන්නිවේදනය සඳහා කුමන හැසිරීමක් භාවිතා කරත් වැදගත් කරුණ වන්නේ, දරුවා එම හැසිරීම ඔබට විශේෂ කරුණක් සන්නිවේදනය සඳහා භාවිතා කරනවාද යන්නයි.

මතක තබාගත යුතු දෙය වන්නේ සමහර දරුවන් සන්නිවේදන උපකරණ භාවිතා කරන බවයි .

# ඇ කොටස සඳහා උපදෙස් ...

## සන්නිවේදන උපකරණ වල භාවිතය

සංකීර්ණ ශරීර ආබාධ සහිත දරුවන් විසින් ඇතැම් විට සංකේත පද්ධතියක් සහිත යාන්ත්‍රික සන්නිවේදන උපකරණ භාවිතා කල හැක. උදාහරණයක් ලෙස ඔවුන්, පිංතූර සංකේත හෝ ඇතැම් විට මුද්‍රණය කල වචන මගින් හඳුනා ගෙන තද කිරීමට (push) හැකි විවිධ පැනල (panels) සහිත විද්‍යුත් උපකරණ භාවිතා කල හැක. ඔවුන් පැනලයක් තද කිරීමේදී පටිගත කල හඬක් මගින් පිංතූර සංකේතයේ හෝ මුද්‍රණය කල වචනයේ අඩංගු පණිවිඩය සඳහන් කරනු ලැබේ. එවැනි සිද්ධීන් වලදී, එම උපකරණයේ අඩංගු සංකේත (පිංතූර, මුද්‍රණය කල වචන හෝ වෙනත් පණිවුඩයක් ප්‍රකාශ කිරීමට යොදාගත හැකි ඕනෑම ආකාරයේ සංකේතයක්) භාවිතා කිරීම නිසා ඔබ විසින් දරුවා අගය කල යුතුය.

සන්නිවේදන උපකරණ ඔස්සේ පාවිච්චි කල හැකි සංකේත වර්ග ලෙස:

**භෞතික සංකේත**

පිංතූර /චිත්‍ර
විශේෂිත වූ පණිවුඩයක් නිරූපණය
කරන වස්තු සංකේත.

**වියුක්ත සංකේත**

ලියා ඇති වචන
බ්‍රේල් වචන
ත්‍රිමාන (3D) සංකේත
ද්විමාන (2D) සංකේත.

**භාශාව**

ඉහත සඳහන් ඕනෑම ආකාරයේ
සංකේත වර්ග වල එකතුවක්.

**ලකුණු කිරීම**

- ඔබ දකින සෑම ප්‍රශ්නයක්ම ඔබේ දරුවාට විවිධාකාරයෙන් ප්‍රකාශ කළ හැකි පණිවිඩයකට සම්බන්ධය.
- සෑම ප්‍රශ්නයක්ම කියවා විස්තර කර ඇති පණිවිඩය ඔබේ දරුවාට කිව හැකිදැයි තීරණය කරන්න.
- පහත ලැයිස්තුවෙන් එම පණිවිඩය ප්‍රකාශ කිරීමට ඔහු භාවිතා කරන්නේ කුමන හැසිරීම්දැයි පරීක්ෂා කරන්න.
- ඔබ පරීක්ෂා කළ කිසියම් හැසිරීමක් ඔබේ දරුවා දැනටමත් සිදු කරනවාද, නැත්නම් තවමත් ඔබේ දරුවා තුළ දියුණු වෙමින් පවතින අවධියක තිබේද යන්නද ඔබ තීරණය කළ යුතුය.
- ඔබ තවමත් දියුණුවෙමින් පවතින බව සලකන හැසිරීම් වලට යාබදව කොටුව තුළ හරස් ඉරක් [/] යොදන්න.
- දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් වලට යාබදව කොටුව තුළ කතිර ලකුණක් [X] යොදන්න.
- හැසිරීම දියුණු කරගෙන තිබේද නැද්ද යන්න තීරණය කිරීමට පහත අර්ථ දැක්වීම් භාවිතා කරන්න:

**[/] දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම්.**

- මෙම හැසිරීම් ඇතැම් අවස්ථාවල පමණක් සිදුකරයි.
- මෙවැනි හැසිරීම් කිරීමට කවුරුන් හෝ පෙළඹවූ විට හෝ උනන්දු කළ විට පමණක් සිදු කරයි.
- මෙවැනි හැසිරීම් සිදු කරන්නේ අවස්ථා එකක් හෝ දෙකක් හෝ එක් පුද්ගලයෙකු සමඟ පමණි.

**[X] දරුවා දැනටමත් සිදු කරන හැසිරීම්.**

- අවස්ථාවක් ලැබුනු විට බොහෝ විට මෙම හැසිරීම් ස්වාධීනව කරයි.
- මෙය විවිධ අවස්ථා ගණනාවක සහ විවිධ පුද්ගලයින් සමඟ කරයි.

## ඇ.1 කිසි දෙයක් ප්‍රතික්ශේප කිරීම.

-ඔබේ දරුවා අරමුණක් සහිතව, යම් කිසි ක්‍රියාවක් හෝ දෙයක් ඔහුට හෝ ඇයට අවශ්‍ය නැති බව පෙන්වයිද?
-එසේ නම්, එය පෙන්වීම සඳහා ඔබගේ දරුවා කරන්නේ කුමක්ද?

**අදියර 03**



### ශරීර චලනය

☐ සම්පූර්ණ ශරීරයම භාවිතා කරන චලන. (ශරීරය ඇඹරවීම, ශරීරය ඉවතට හැරවීම)

☐ හිසෙහි චලන (හිස ඉවතට හෝ පැත්තට හැරවීම.)

☐ අත්වල හෝ බාහු වල චලන.

☐ කකුලේ චලන (පයින් ගැසීම හෝ කකුල් පොළවේ ගැසීම)



### මූලික ශබ්ද

☐ කෑගසීම හෝ කන්කෙදිරි ගෑම



### මුහුණේ ඉරියව්

☐ රැවීම, අකමැති බව හැඟවීමට මුහුණේ ඉරියව් වෙනස් කිරීම.



### සරල ඉඟි

☐ භාණ්ඩයක් හෝ පුද්ගලයෙක් අහකට තල්ලු කිරීම.

**අදියර 04**



### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

☐ අවශ්‍ය නොකරන භාණ්ඩ ඔබට නැවත ලබාදීම.

☐ එපා යැයි පැවසීමට ඔලුව සෙලවීම.

☐ විශේෂ ශබ්ධ නැගීම (උදා: අහ් අහ්)

**අදියර 05**




### භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)

☐ පිංතූර සංකේතය ප්‍රතික්ශේප කිරීම හෝ අනවශ්‍ය භාණ්ඩය පිංතූරයට නැගීම.

☐ අනවශ්‍ය පිංතූරය පෙන්වන්නාවූ භාණ්ඩ සංකේතය ප්‍රතික්ශේප කිරීම.

අදියර 06




## වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)

☐ බ්‍රේල් වචන (එපා / නවතින්න)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (එපා/ ඉවරයි)

☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (එපා/ නවතින්න)

☐ වචනයෙන් පවසන දේවල් (එපා, ඉවරයි)

☐ අතින් කරන සංඥා (එපා, නවතින්න)

☐ ලියා ඇති වචන (එපා/ ඉවරයි)

අදියර 07




## භාෂාව

☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (ඒක නවත්තන්න, ඔක්කොම ඉවරයි, නෑ එළියට යන්න)

සංකේත වර්ග

...............................

## ඇ.2 යම්කිසි ක්‍රියාවක් තව දුරටත් / නැවත නැවත ඉල්ලීම

-ඔබේ දරුවා අරමුණක් සහිතව, ඔබ විසින් කරමින් සිට නවත්වන ලද ක්‍රියාවක් නැවත කිරීමට අවශ්‍ය බව පෙන්වයිද?
(උදා: හැංගිමුත්තන් හෝ සෙල්ලම් බඩුවකින් සෙල්ලම් කිරීම)
-එසේ නම්, එය පෙන්වීම සඳහා ඔබගේ දරුවා කරන්නේ කුමක්ද?

**අදියර 03**



### ශරීර චලනය

- ☐ සම්පූර්ණ ශරීරයම භාවිතා කරන චලන. (ඉදිරියට පැනීම)
- ☐ අත් වල හෝ බාහු වල චලන (බාහු නැවීම)
- ☐ කකුලේ චලන (පයින් ගැසීම)




### මූලික අවධියේ ශබ්ධ

- ☐ ඉතා සෙමින් හා පහත් හඩින් ශබ්ධ මිමිණීම, උස් හඩින් දිගු වේලාවක් හැඩීම, හයියෙන් සිනාසීම.



### මුහුණේ ඉරියව්

- ☐ සිනාසීම



### පෙනීම

- ☐ ඔබ දෙස බැලීම.



### සරල ඉඟි

- ☐ ඔබේ අත ගැනීම
- ☐ ඔබව ඇල්ලීම
- ☐ ඔබ දෙසට ඒම හෝ ඔබට තට්ටු කිරීම.

**අදියර 04**



### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

- ☐ ඉගියකින් ඔබට එන්න යැයි පැවසීම.
- ☐ වඩාගැනීමට දෑත් දිගු කිරීම.
- ☐ යමක් අනුමත කිරීමට ඔලුව වැනීම.


**අදියර 05**



### භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු

- ☐ තමාට අවශ්‍ය දෙය රූපයට නැගීම.
- ☐ අවශ්‍ය භාණ්ඩයකට අදාළ සංකේතය පෙන්වීම.

අදියර 06




**වියුක්ත සංකේත (**කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත

- ☐ වචනයෙන් පවසන දේවල් (තව දෙන්න, කුවු කවන්න.)
- ☐ අතින් කරන සංඥා (තව දෙන්න, පද්දන්න.)
- ☐ ලියා ඇති වචන (තව දෙන්න, කුවු කවන්න.)
- ☐ බ්‍රේල් වචන (තව දෙන්න, පද්දන්න)
- ☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (තව දෙන්න, කුවු කවන්න)
- ☐ වියුක්ත ද්විමාන (2D)

අදියර 07




**භාෂාව**

- ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (තව කුවු කවන්න / ඒක ආයේ කරන්න.)

සංකේත වර්ග

……………………………
……………………………
……

## ඇ.3 අලුත් ක්‍රියාවක් කිරීමට ඉල්ලීම

-ඔබගේ දරුවා විසින්, ඔහුට ඔබ විසින් නොකරන ලද අලුත් ක්‍රියාවක් සිදු කිරීමට අවශ්‍ය බව අරමුණක් සහිතව පෙන්වයිද? -එසේ නම් ඔබගේ දරුවා අලුත් ක්‍රියාව ඔබෙන් ඉල්ලන්නේ කෙසේද?

**අදියර 03**



### ශරීර චලනය

☐ සම්පූර්ණ ශරීරයම භාවිතා කරන චලන. (නව ක්‍රියාවකට ඇති කැමැත්ත පෙන්වීමට උඩ පැනීම.)


☐ අත් වල හෝ බාහු වල චලන (නව ක්‍රියාවක් කරන ආකාරයට බාහු එහා මෙහා පැද්දීම.)

☐ කකුලේ චලන (නව ක්‍රියාවක් කරන ආකාරයට කකුල් එහා මෙහා පැද්දීම)



### සරල ඉඟි

☐ ඔබේ අතින් ඇල්ලීම



### පෙනීම

☐ පුද්ගලයා දෙස බැලීම.



### මුහුණේ ඉරියව්

☐ සිනාසීම

**අදියර 04**



### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

☐ ඉඟියකින් ඔබට එන්න යැයි පැවසීම.

☐ වඩාගැනීමට දෑත් දිගු කිරීම.

**අදියර 05**




### භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු

☐ තමාට අවශ්‍ය ක්‍රියාවට අදාළ රූපය පෙන්වීම හෝ රූපයට නැගීම.

☐ අවශ්‍ය ක්‍රියාවට අදාළ භාණ්ඩයකට ගැලපෙන සංකේතය පෙන්වීම.

☐ අවශ්‍ය ක්‍රියාව රඟ දක්වා පෙන්වීම.

අදියර 06




**වියුක්ත සංකේත (**කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)

☐ වචනයෙන් පවසන දේවල් (කුවු කවන්න.)

☐ අතින් කරන සංඥා (කන්න.)


☐ ලියා ඇති වචන (කුවු කවන්න.)

☐ බ්‍රේල් වචන (පද්දන්න)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (පද්දන්න)

☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (කුවු කවන්න)

අදියර 07




**භාෂාව**

☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (මට කුවු කවන්න / මට ඔන්චිලි පදින්න ඕනේ.)

සංකේත වර්ග

……………………..

## ඇ.4 භාණ්ඩයක් නැවත ඉල්ලීම.

-ඔබගේ දරුවා හට සෙල්ලම් කල සෙල්ලම් බඩුවක් හෝ ආහාරයට ගත් කෑමක් වැනි දෙයක් නැවත අවශ්‍ය වූ විට එය අරමුණක් සහිතව ප්‍රකාශ කරයිද?


-එසේනම් ඔබගේ දරුවා එය නැවත ඉල්ලන්නේ කෙසේද?

**අදියර 03**



### ශරීර චලනය

- ☐ සම්පූර්ණ ශරීරයම භාවිතා කරන චලන. (භාණ්ඩය දෙසට පැනීම.)
- ☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ඔලුව හැරවීම.
- ☐ අත් වල හෝ බාහු වල චලන.
- ☐ කකුල් වල චලන.



### පෙනීම

- ☐ අවශ්‍ය භාණ්ඩය දෙස බැලීම.



### මුහුණේ ඉරියව්

- ☐ සිනාසීම



### මූලික අවධියේ ශබ්ධ

- ☐ කරදරකාරී ලෙස හඬනැගීම,උස් හඬින් දිගු වේලාවක් හැඩීම හෝ



### සරල ඉඟි

- ☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ඔබව ගෙනයාම හෝ ඇදගෙන යාම.
- ☐ අවශ්‍ය භාණ්ඩය ඇල්ලීම (භාණ්ඩය ළඟට නොගෙන)
- ☐ භාණ්ඩය දෙසට ලගාවීම හෝ භාණ්ඩයට තට්ටු කිරීම.

**අදියර 04**



### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

- ☐ අවශ්‍ය භාණ්ඩය හා ඔබ දෙස මාරුවෙන් මාරුවට බැලීම.
- ☐ අවශ්‍ය භාණ්ඩයට අත දිගුකර පෙන්වීම.


**අදියර 05**



### භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු

- ☐ තමාට අවශ්‍ය ක්‍රියාවට අදාළ රූපය පෙන්වීම හෝ රූපයට නැගීම.
- ☐ අවශ්‍ය ක්‍රියාවට අදාළ භාණ්ඩයකට ගැලපෙන සංකේතය පෙන්වීම.
- ☐ අවශ්‍ය ක්‍රියාව රඟ දක්වා පෙන්වීම.

අදියර 06




**වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ**

☐ වචනයෙන් පවසන දේවල් (තව දෙන්න, බෝලේ)

☐ අතින් කරන සංඥා (තව දෙන්න, බෝනික්කා.)

☐ ලියා ඇති වචන (තව දෙන්න, බෝලේ)

☐ බ්‍රේල් වචන (තව දෙන්න, බීම)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (තව දෙන්න, බෝලේ)

☐ වියුක්ත ද්විමාන (2D)

අදියර 07




**භාෂාව**

☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (බීම තව දෙන්න, සබන්බෝල තව ඕනේ.)

සංකේත වර්ග

…………………………
…………………………

# ඇ.5 දේවල් අතරින් තේරීම


-යම් දේවල් දෙකක් හෝ කිහිපයක් අතරින් ඔබගේ දරුවාට එක දෙයක් තේරීමට හැකියාව තිබේද?
-මෙහිදී, ඔබ විසින් දෙන සියලුම දේවල් දරුවා හඳුනාගත යුතු අතර දරුවා පළමුව දකිනා ලද දෙය ඔහුගේ/ ඇයගේ තේරීම නොවිය යුතු බව මතක තබා ගත යුතුය.
-එසේ නම් ඔබගේ දරුවා යම් තේරීමක් සිදුකරන්නේ කෙසේද?

**අදියර 03**



**ශරීර චලනය**

- ☐ සම්පූර්ණ ශරීරයම භාවිතා කරන චලන. (භාණ්ඩය දෙසට පැනීම.)
- ☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ඔලුව හැරවීම.



**පෙනීම**

- ☐ අවශ්‍ය භාණ්ඩය දෙස බැලීම.



**සරල ඉඟි**

- ☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ඔබේ අත ගෙන යාම.
- ☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ලගාවීම,භාණ්ඩය ඇල්ලීම හෝ භාණ්ඩයට තට්ටු කිරීම.

**අදියර 04**



**සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.**

- ☐ අවශ්‍ය භාණ්ඩය හා ඔබ දෙස මාරුවෙන් මාරුවට බැලීම.
- ☐ අවශ්‍ය භාණ්ඩයට අත දිගුකර පෙන්වීම.


**අදියර 05**



**භෞතික සංකේත** (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)

- ☐ තමාට අවශ්‍ය භාණ්ඩයක රූපය පෙන්වීම හෝ රූපයට නැගීම.
- ☐ අවශ්‍ය භාණ්ඩයක, භාණ්ඩයකට අදාළ සංකේතය පෙන්වීම.
- ☐ අවශ්‍ය භාණ්ඩය රඟ දක්වා පෙන්වීම.
- ☐ අවශ්‍ය භාණ්ඩයට අදාළ ශබ්ධ තාලයකට මිමිණීම.

අදියර 06




## **වියුක්ත සංකේත (**කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ

☐ වචනයෙන් පවසන දේවල් (අරක හෝ භාණ්ඩයේ නම)

☐ බ්‍රේල් වචන (භාණ්ඩයේ නම)

☐ අතින් කරන සංඥා (අරක හෝ භාණ්ඩයේ නම)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (භාණ්ඩයේ නම)

☐ ලියා ඇති වචන (භාණ්ඩයේ නම)

☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (භාණ්ඩයේ නම)

අදියර 07




## **භාෂාව**

☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (අරක, අන්න අරක ඕනේ, මට කෝච්චිය ඕනේ.)

සංකේත වර්ග

…………………………
…………………………

## ඇ.6 අලුත් භාණ්ඩයක් ඉල්ලීම

-ඔබගේ දරුවා ඔහුට පෙනුන, ඇසුන හෝ ඇල්ලූ නමුත්,

-ඔබ විසින් ඔබේ දරුවාට ලබා නොදුන් සෙල්ලම් බඩුවක් හෝ කෑමක් වැනි අලුත් දෙයක්, අරමුණක් සහිතව අවශ්‍ය බව පෙන්වයිද?

-එසේ නම්, නම් ඔහු අලුත් භාණ්ඩයක් ඉල්ලන්නේ කෙසේද?


**අදියර 03**



### ශරීර චලනය

☐ සම්පූර්ණ ශරීරයම භාවිතා කරන චලන. (භාණ්ඩය දෙසට පැනීම.)

☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ඔලුව හැරවීම.



### පෙනීම

☐ අවශ්‍ය භාණ්ඩය දෙස බැලීම.



### සරල ඉඟි

☐ අවශ්‍ය භාණ්ඩය දෙසට ඔබව ගෙනයාම හෝ ඇදගෙන යාම.

☐ අවශ්‍ය භාණ්ඩය ඇල්ලීම. (භාණ්ඩය ලඟට නොගෙන)

**අදියර 04**



### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

☐ අවශ්‍ය භාණ්ඩය හා ඔබ දෙස මාරුවෙන් මාරුවට බැලීම.

☐ අවශ්‍ය භාණ්ඩයට අත දිගුකර පෙන්වීම.

**අදියර 05**



### භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)


☐ තමාට අවශ්‍ය භාණ්ඩයක රූපය පෙන්වීම හෝ රූපයට නැගීම.

☐ අවශ්‍ය භාණ්ඩය රඟ දක්වා පෙන්වීම.

☐ අවශ්‍ය භාණ්ඩයක, භාණ්ඩයකට අදාළ සංකේතය පෙන්වීම.

☐ අවශ්‍ය භාණ්ඩයට අදාළ ශබ්ධ තාලයකට මිමිණීම.

අදියර 06




**වියුක්ත සංකේත (**කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත

- ☐ වචනයෙන් පවසන දේවල් (කාර්)
- ☐ අතින් කරන සංඥා (බෝනික්කා)
- ☐ ලියා ඇති වචන (බෝලය)
- ☐ බ්‍රේල් වචන (බිස්කට්)
- ☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (කාර්)
- ☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (බීම)

අදියර 07




**භාෂාව**

- ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (කාර් එක ඕනේ, මට බෝනික්කා ඕනේ)


සංකේත වර්ග

............................

............................

# ඇ.7 ළඟ නොමැති භාණ්ඩයක් ඉල්ලීම

- ඔබේ දරුවා ඔහුගේ / ඇයගේ ළඟ නොමැති, සෙල්ලම්බඩු, කෑම, පුද්ගලයින් වැනි, පෙනීමට නොමැති, ඇසීමට නොහැකි, ඇල්ලීමට නොහැකි හෝ වෙනත් කාමරයක ඇති දෙයක් අරමුණක් සහිතව ඉල්ලයිද?
- එසේ නම් ඔබගේ දරුවා ඔහුගේ ලග නොමැති දෙයක් ඉල්ලන්නේ කෙසේද?

| අදියර 05 | අදියර 06 | අදියර 07 |
|---|---|---|
|  **භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)** |   **වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)** |   **භාෂාව** |
| ☐ තමාට අවශ්‍ය භාණ්ඩයක/ පුද්ගලයෙකුගේ රූපය පෙන්වීම හෝ රූපයට නැගීම.<br><br>☐ අවශ්‍ය භාණ්ඩයක/ පුද්ගලයෙකුගේ, භාණ්ඩයකට අදාළ සංකේතය පෙන්වීම.<br><br>☐ අවශ්‍ය භාණ්ඩය රඟ දක්වා පෙන්වීම.<br><br>☐ අවශ්‍ය භාණ්ඩයට අදාළ ශබ්ධ තාලයකට මිමිණීම. | ☐ වචනයෙන් පවසන දේවල් (බෝලය)<br><br>☐ අතින් කරන සංඥා (බෝනික්කා)<br><br>☐ ලියා ඇති වචන (බිස්කට්)<br><br>☐ බ්‍රේල් වචන (බීම)<br><br>☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (පොත)<br><br>☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (බෝලය) | ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (බෝලේ ඕනේ, මට කාර් එක ඕනේ)<br><br>සංකේත වර්ග<br><br>…………………………<br>………………………… |

## ඇ.8 අවධානය ඉල්ලීම

- දරුවා ඔබගේ අවධානය ඔහු වෙතට ලබාගැනීමට අරමුණකින් යුතුව ක්‍රියාකරයිද?
-එසේ නම් ඔබගේ දරුවා ඒ සඳහා කරන්නේ කුමක්ද?

**අදියර 03**




### මූලික අවධියේ ශබ්ධ

☐ ඉතා සෙමින් හා පහත් හඩින් ශබ්ධ මිමිණීම, උස් හඩින් දිගු වේලාවක් හැඩීම හෝ ශබ්ධ නැගීම.



### මුහුණේ ඉරියව්

☐ සිනාසීම



### පෙනීම

☐ පුද්ගලයා දෙස බැලීම.



### සරල ඉඟි

☐ අත් වල හෝ බාහු වල චලන (බාහු නැවීම)

☐ ඔබව ඇල්ලීම

☐ දුරකථනයෙන් ඇමතුමක් ගැනීම හෝ ස්විච්චයක් දමන අයුරු නිරූපණය කිරීම.

**අදියර 04**




### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

☐ අවශ්‍ය භාණ්ඩය හා ඔබ දෙස මාරුවෙන් මාරුවට බැලීම.

☐ අවශ්‍ය භාණ්ඩයට අත දිගුකර පෙන්වීම.

**අදියර 06**




**වියුක්ත සංකේත** (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)

- ☐ වචනයෙන් පවසන දේවල් (බලන්න, අම්මා)
- ☐ බ්‍රේල් වචන (බලන්න, මාලා)
- ☐ අතින් කරන සංඥා (බලන්න, තාත්තා)
- ☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (බලන්න, අම්මා)
- ☐ ලියා ඇති වචන (බලන්න, අම්මා.)
- ☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (බලන්න, ටීව)

**අදියර 07**




**භාෂාව**

- ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (තාත්තා බලන්න, මගේ දිහා බලන්න)

සංකේත වර්ග

..........................
..........................

# ඇ.9 සෙනෙහස දැක්වීම


ඔබගේ දරුවා අරමුණක් සහිතවම ඔබව හෝ වෙනත් කෙනෙක් කෙරෙහි සෙනෙහස දක්වයිද?
එසේ නම් ඔබගේ දරුවා සෙනෙහස දැක්වීම සඳහා කරන්නේ කුමක්ද?

## අදියර 03



### මූලික අවධියේ ශබ්ධ

☐ ඉතා සෙමින් හා පහත් හඬින් ශබ්ධ මිමිණීම, උස් හඬින් දිගු වේලාවක් හැඬීම.



### පෙනීම

☐ පුද්ගලයා දෙස බැලීම.



### සරල ඉඟි

☐ අත් වල හෝ බාහු වල චලන (අත් නැවීම)

☐ ඔබව ඇල්ලීම.



### මුහුණේ ඉරියව්

☐ සිනාසීම

## අදියර 04



### සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.

☐ වැලඳ ගැනීම, සිප ගැනීම, ආදරයෙන් තට්ටු කිරීම.


## අදියර 05



### භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)

☐ ආදරය විදහා දක්වන ආකාරයේ රූප පෙන්වීම හෝ රූප ඇඳීම.

## අදියර 06




### වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)

☐ වචනයෙන් පවසන දේවල් (ආදරය)

☐ අතින් කරන සංඥා (වැලඳ ගැනීම)

☐ ලියා ඇති වචන (ආදරය)

☐ බ්‍රේල් වචන (ආදරය)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (වැලඳ ගැනීම)

☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (ආදරය)

## අදියර 07




### භාෂාව

☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (ඔයාට ආදරෙයි, මං අම්මා වගේ)

සංකේත වර්ග

..........................
..........................

## ඇ.10 ආචාර කිරීම

ඔබගේ දරුවා යම් කෙනෙකු පැමිණි විට හා පිටව යන විටදී හායි හෝ බායි,ටටා යනුවෙන් අරමුණකින් යුතුව ප්‍රකාශ කරයිද? ඔව් නම් ඔබගේ දරුවා ඔබට හෝ අන් අයට ආචාර කරන්නේ කෙසේද?

අදියර 04



**සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.**

☐ හායි හෝ බායි ලෙස අත වැනීම.


අදියර 05



**භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)**

☐ ආචාර දැක්වීම පෙන්වන ආකාරයේ රූපය පෙන්වීම හෝ රූප ඇදීම ( හායි,ටටා/ බායි)

අදියර 06




**වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ**

☐ වචනයෙන් පවසන දේවල් (හායි ,බායි/ටටා)

☐ අතින් කරන සංඥා

(හායි, බායි/ටටා)

☐ ලියා ඇති වචන (හායි ,බායි)

☐ බ්‍රේල් වචන (හායි ,බායි)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (හායි ,බායි)

☐ වියුක්ත ද්විමාන (2D)

අදියර 07




**භාෂාව**


☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (අම්මා බායි, ගුඩ් මෝනින් තාත්තා)

සංකේත වර්ග

……………………
……………………


**ඇ.11** 
# දේවල් බෙදා ගැනීම

-ඔබගේ දරුවා අරමුණකින් යුතුව නැවත යමක් බලාපොරොත්තු නොවෙමින් ඔබ සමඟ යම් යම් දේවල් බෙදාගනීද?
-එසේ නම් දරුවා ඔබ සමඟ දේවල් බෙදා ගන්නේ කෙසේද?

| අදියර 04 | අදියර 06 | අදියර 07 |
| --- | --- | --- |
|  **සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම.**<br><br>ඔබට යමක් දීම හෝ පෙන්වීම.<br><br>ප්‍රශ්නාර්ථයක් හා සමාන විශේෂිත වූ ශබ්ධ නැගීම. |  **වියුක්ත සංකේත (**කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)<br><br>වචනයෙන් පවසන දේවල් (ඔයාගේ)<br><br>අතින් කරන සංඥා (ඔයාගේ)<br><br>ලියා ඇති වචන (ඔයාගේ)<br><br>බ්‍රේල් වචන (ඔයාගේ)<br>වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (ඔයාගේ)<br>වියුක්ත ද්විමාන (2D) සංකේත (ඔයාගේ) |  **භාෂාව**<br><br>සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (ඔයාට, ඔයාට බිස්කට්)<br><br>සංකේත වර්ග<br><br>............................<br>............................ |


## ඇ.12 ඔබගේ අවධානය දරුවා කැමති යමක් වෙත යොමු කිරීම

- ඔබගේ දරුවා අරමුණකින් යුතුව ඔහු / ඇය කැමති දෙයක් වෙත --ඔබගේ අවධානය ලබාගනීද?
-එසේ නම් දරුවා යම් දෙයක් කෙරෙහි ඔබේ අවධානය ලබාගන්නේ කෙසේද?

| අදියර 04 | අදියර 06 | අදියර 07 |
| --- | --- | --- |
|  **සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැඟීම්.**<br><br>☐ අවශ්‍ය භාණ්ඩයට අත දිගුකර පෙන්වීම.<br><br>☐ අවශ්‍ය භාණ්ඩය, පුද්ගලයා හෝ ස්ථානය දෙස මාරුවෙන් මාරුවට බැලීම. |   **වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)**<br><br>☐ වචනයෙන් පවසන දේවල් (බලන්න, අතන)<br><br>☐ අතින් කරන සංඥා (බලන්න, අතන)<br><br>☐ ලියා ඇති වචන (බලන්න, අතන)<br><br>☐ බ්‍රේල් වචන (බලන්න, අතන)<br><br>☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (බලන්න, අතන)<br><br>☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (බලන්න, අතන) |   **භාෂාව**<br><br>☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (අන්න අතන, අරක දිහා බලන්න)<br><br>සංකේත වර්ග<br><br>..........................<br>.......................... |

## ඇ.13 ආචාරශීලී වචන භාවිතය

-ඔබගේ දරුවා සමාජ සම්බන්ධතා පැවැත්වීමේදී කරුණාකර, ස්තූතියි වැනි ආචාරශීලී වචන අරමුණකින් යුතුව භාවිතා කර ඔබගෙන් අවසර ලබාගනීද?
-එසේ නම් ඔබගේ දරුවා කුමන ආකාරයේ ආචාරශීලී වැකි භාවිතා කරයිද?

| අදියර 04 | අදියර 06 | අදියර 07 |
|---|---|---|
|  **සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැඟීම්.** |  **වියුක්ත සංකේත** (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන) |  **භාෂාව** |
| ☐ “මට එය ලබාගැනීමට හැකිද?” යන්න පෙන්වන ආකාරයෙන් දෙයකට අත දිගු කිරීම.<br>☐ “මම කරන්නද?” යනුවෙන් හගවන විශේශිත ශබ්ධ සිදුකිරීම. | ☐ වචනයෙන් පවසන දේවල් (කරුණාකර)<br>☐ අතින් කරන සංඥා (ස්තූතියි)<br>☐ ලියා ඇති වචන (කරුණාකර)<br>☐ බ්‍රේල් වචන (සමාවෙන්න)<br>☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (කරුණාකර)<br>☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (ස්තූතියි) | ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (“අම්මේ මම කරන්නද? අනේ දෙන්න”)<br>සංකේත වර්ග<br>…………………… |

## ඇ.14 ඔව් නෑ ප්‍රශ්නවලට පිලිතුරු දීම.

-ඔබගේ දරුවා අරමුණකින් යුතුව යම් ප්‍රශ්නයකට ඔව්, නෑ, මම දන්නේ නෑ වැනි පිලිතුරු ලබා දෙයිද?
එසේ නම් ඔබගේ --දරුවා ඔව් නෑ ප්‍රශ්නවලට පිලිතුරු දෙන්නේ කෙසේද?


### අදියර 04



**සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැගීම්.**

- ☐ ඔව් යන්න පැවසීමට ඔලුව වැනීම.
- ☐ නෑ යන්න ඔලුව සෙලවීම.
- ☐ උරහිස් සෙලවීම.
- ☐ ඔව් නෑ යන්න පෙන්වන ආකාරයේ විශේෂිත ශබ්ධ සිදුකිරීම. (''උහ්-අහ්'', ''නු- අහ්'')

### අදියර 06




**වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)**

- ☐ වචනයෙන් පවසන දේවල් (ඔව්, නෑ)
- ☐ අතින් කරන සංඥා (ඔව්, නෑ)
- ☐ ලියා ඇති වචන (ඔව්, නෑ)
- ☐ බ්‍රේල් වචන (ඔව්, නෑ)
- ☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (ඔව්, නෑ)
- ☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (ඔව්, නෑ)

### අදියර 07




**භාෂාව**

- ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. ("කොහෙත්ම නෑ" "මම දන්නේ නෑ")

සංකේත වර්ග


……………………
……………………

**ඇ.15**

# ප්‍රශ්න ඇසීම

-ඔබගේ දරුවා පිලිතුරක් බලාපොරොත්තුවෙන් ඔබගෙන් ප්‍රශ්න අසයිද? (වචන භාවිතා කිරීම අත්‍යාවශ්‍ය නොවේ)

-එසේ නම් ඔබගේ දරුවා ප්‍රශ්න අසන්නේ කෙසේද?

| අදියර 04 | අදියර 06 | අදියර 07 |
|---|---|---|
|  **සාම්ප්‍රදායික ඉඟි හා ශබ්ධ නැඟීම්.** |  **වියුක්ත සංකේත**<br>(කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන) |  **භාෂාව** |
| ☐ ප්‍රශ්නයක් අසන ආකාරයෙන් අතින් අල්ලා ගැනීම, උරහිස් සෙලවීම.<br><br>☐ ප්‍රශ්න අසන අයුරින් විශේෂිත ශබ්ධ කිරීම.<br><br>☐ භාණ්ඩය හෝ ස්ථානය හා ඔබ දෙස මාරුවෙන් මාරුවට බැලීම. | ☐ වචනයෙන් පවසන දේවල් (කවුද? මොකද්ද? කොහේද? කවද්ද? ඇයි?)<br><br>☐ අතින් කරන සංඥා (කවුද? මොකද්ද? කොහේද? කවද්ද? ඇයි?)<br><br>☐ ලියා ඇති වචන (කවුද? මොකද්ද? කොහේද? කවද්ද? ඇයි?)<br><br>☐ බ්‍රේල් වචන (කවුද? මොකද්ද? කොහේද? කවද්ද? ඇයි?)<br><br>☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (කවුද? මොකද්ද? කොහේද? කවද්ද? ඇයි?) | ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (“ඒ කවුද?” “ඔයා කොහේද ගියේ”)<br><br>සංකේත වර්ග<br><br>…………………… |

# ඇ.16 දේවල් හෝ පුද්ගලයන් නම් කිරීම.

-ඔබගේ දරුවා වෙනත් කෙනෙකුගේ බලපෑමකින් තොරව ඔබ අසන ලද ප්‍රශ්නයකට පිලිතුරක් ලෙස භාණ්ඩ, පුද්ගලයින් හෝ ක්‍රියාවන් නම් කරයිද?
-එසේ නම් ඔබගේ දරුවා යම් දෙයක් නම් කරන්නේ කෙසේද?

### අදියර 05



**භෞතික සංකේත (පිංතූර සංකේත, වස්තු සංකේත සහ ඇතැම් ඉඟි)**


☐ තමාට අවශ්‍ය භාණ්ඩයක, පුද්ගලයෙකුගේ, ස්ථානයක හෝ ක්‍රියාවක රූපය පෙන්වීම හෝ රූපයට නැගීම.

☐ අවශ්‍ය භාණ්ඩයක, පුද්ගලයෙකුගේ ස්ථානයක හෝ ක්‍රියාවක අදාළ සංකේතය පෙන්වීම.

☐ අවශ්‍ය භාණ්ඩය හෝ ක්‍රියාව රඟ දක්වා පෙන්වීම.

☐ අවශ්‍ය භාණ්ඩයට අදාළ ශබ්ධය තාලයකට මිමිණීම.

### අදියර 06




**වියුක්ත සංකේත**

(කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන)

☐ වචනයෙන් පවසන දේවල් (භාණ්ඩයේ නම)

☐ අතින් කරන සංඥා (භාණ්ඩයේ නම)

☐ ලියා ඇති වචන (භාණ්ඩයේ නම)

☐ බ්‍රේල් වචන (භාණ්ඩයේ නම)

☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (භාණ්ඩයේ නම)

☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (භාණ්ඩයේ නම)

### අදියර 07




**භාෂාව**


☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (“ඒ කාර් එක’’ “මේ කාර් එක”)

සංකේත වර්ග

……………………… ……………………… ………………..

## ඇ.17 අදහස් දැක්වීම

-ඔබගේ දරුවා වෙනත් අයෙකුගේ උපකාරයක් නොමැතිව (ඔබගේ ප්‍රශ්න කිරීමකින් තොරව) යම් යම් දේවල් පිලිබඳව අදහස් දක්වයිද? (ඒක ලස්සනයි'' ''රස්නෙයි'')
-එසේ නම් දරුවා යම් දෙයක් පිලිබඳ අදහස් දක්වන්නේ කෙසේද?

| අදියර 05 | අදියර 06 | අදියර 07 |
|---|---|---|
|  **භෞතික සංකේත** (පිංතූර සංකේත, වස්තු |  **වියුක්ත සංකේත** (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන) |  **භාෂාව** |
| ☐ තමාට අවශ්‍ය භාණ්ඩයක, පුද්ගලයෙකුගේ, ස්ථානයක ක්‍රියාවක හෝ තත්වයක රූපය පෙන්වීම හෝ රූපයට නැගීම. | ☐ වචනයෙන් පවසන දේවල් (ලස්සනයි) | ☐ සංකේත දෙකක් හෝ කිහිපයක් සම්බන්ධ කිරීම. (''ඔයා හොඳයි'' ''ඒක ගොඩාක් සීතලයි'')<br><br>සංකේත වර්ග<br><br>…………………<br>………………… |
| ☐ අවශ්‍ය භාණ්ඩයක, පුද්ගලයෙකුගේ ස්ථානයක, ක්‍රියාවක හෝ තත්වයක අදාළ සංකේතය පෙන්වීම. | ☐ අතින් කරන සංඥා (සීතලයි) | |
| ☐ අවශ්‍ය භාණ්ඩය, ක්‍රියාව පුද්ගලයා හෝ තත්වය රඟ දක්වා පෙන්වීම. | ☐ ලියා ඇති වචන (රස්නෙයි) | |
| | ☐ බ්‍රේල් වචන (නරකයි) | |
| | ☐ වියුක්ත ත්‍රිමාන (3D) සංකේත (හොඳයි) | |
| | ☐ වියුක්ත ද්විමාන (2D) සංකේත (කහ පාට) | |

# පැතිකඩ (profile)...


පැතිකඩ සැලසුම් කර ඇත්තේ ඔබේ දරුවාගේ සන්නිවේදන කුසලතා පිළිබඳ එක් පිටුවක පෙනෙන ආකාරයේ සාරාංශයක් ලබා දීම සඳහා ය. 2-5 පිටුවල සාකච්ඡා කර ඇති සන්නිවේදන මට්ටම් හත සහ සන්නිවේදනය සඳහා ප්‍රධාන හේතු හතර භාවිතා කරමින් සන්නිවේදනය සම්බන්ධයෙන් ඔබේ දරුවා වර්ධනය වන ආකාරය බැලූ බැල්මට එය පෙන්වනු ඇත.

සංකීර්ණ ශාරීරික ආබාධ සහිත දරුවෙකුට සන්නිවේදනය සඳහා, ඇස් බැල්ම හෝ සරල ස්විචයක් සක්‍රිය කිරීම වැනි හැසිරීම් 1-2 පමණක් කළ හැකි බව තේරුම් ගැනීම වැදගත්ය. පැතිකඩ (profile) ප්‍රතිඵල මඟින් යම් පණිවිඩයක් සන්නිවේදනය කිරීමේ එක් මාර්ගයක් පමණක් ඇති අයෙකු සහ, එකම පණිවිඩය සන්නිවේදනය කිරීමට විවිධ ක්‍රම ඇති අය අතර වෙනස හඳුනාගත නොහැක.

දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් හා දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම් අතර වෙනස හඳුනා ගැනීමට පැතිකඩ (profile) ප්‍රතිඵල යොදාගත හැකිය. කිසියම් පණිවිඩයක් සඳහා දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් ලෙස අනුකෘතියේ ලකුණු කර ඇත්නම් (පණිවිඩයක් මැට්‍රික්ස් හි අනුකෘතියේ එක් කොටුවකින් නිරූපණය වේ), එහි අඩංගු සමහර හැසිරීම් දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම් වුවද ,එම පණිවිඩය පැතිකඩෙහි දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් ලෙස ලකුණු කල යුතුය. පහත දැක්වෙන උදාහරණයේ, තද පාටින් දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් වලට අදාළ කොටු අඳුරු කර ඇත. ඉරි වලින් අඳුරු කර ඇත්තේ දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම් වලට අදාළ කොටු වේ.

පැතිකඩෙහි අඳුරු කරන ලද කොටස් මඟින් ඔබේ දරුවාට දැන් සන්නිවේදනය කළ හැකි පණිවිඩ මොනවාද සහ එම පණිවිඩ සන්නිවේදනය කිරීම සඳහා ඔබේ දරුවා භාවිතා කරන සන්නිවේදන හැසිරීම් මට්ටම පෙන්වයි. බොහෝ දරුවන් ඕනෑම වේලාවක සන්නිවේදන මට්ටම් 2ක් හෝ වැඩි ගණනක් යොදාගනී.

ඔබ සන්නිවේදන අනුකෘතියේ 6 වන පිටුවේ (ආරම්භය), 2 හෝ 3 විකල්ප පරීක්ෂා කර තිබේනම්, මුල්ම සන්නිවේදන මට්ටම් (මට්ටම් I සහ II) හා සම්බන්ධ අ සහ / හෝ ආ කාණ්ඩවල ප්‍රශ්නවලට පිළිතුරු ලබා දී නැත.එවිට ,පැතිකඩෙහි එම මට්ටම්වලට අදාළ කොටස් වල කිසිවක් නොපෙන්වයි (පහත උදාහරණයේ මෙන්). මෙයට හේතුව වන්නේ දරුවා මෙම සන්නිවේදන මට්ටමට වඩා ඉහළ සන්නිවේදන මට්ටමක් දැනටමත් සන්නිවේදනයට යොදාගැනීමය



## පැතිකඩ සම්පූර්ණ කිරීමට ක්‍රම තුනක් ඇත.

ඔබ ඉහත සම්පූර්ණ කරන ලද තොරතුරු පැතිකඩ වෙත මාරු කිරීම තරමක් උපක්‍රමශීලී ය. ඒ සඳහා ක්‍රම තුනක් තිබේ: ඒවා නම් එය,

- ❖ ඔබ විසින්ම සිදු කිරීම,
- ❖ ඔබේ දරුවාගේ අධ්‍යාපන කණ්ඩායමේ කෙනෙකුගෙන් එය කරන ලෙස ඉල්ලා සිටීම.
- ❖ මාර්ගගතව (online) සිදු කිරීම.

### 1. ඔබ විසින්ම සිදු කිරීම.

පහත දැක්වෙන උපදෙස් භාවිතා කරමින් ඔබට ඇගයුමේ මුල් කොටස් වල (පිටු අංක 6 -32 දක්වා) සිට පැතිකඩ වෙත තොරතුරු මාරු කළ හැකිය. ඇගයුමේ, අ 1, අ 3, ආ 1-ආ 4 සහ ඇ 1- ඇ 17 යන කොටස් වලදී ඔබේ දරුවා සන්නිවේදනය කරන විශේෂිත ක්‍රම ඔබ පරීක්ෂා කර ඇත. මෙම සෑම අයිතමයක් යටතේම, මුල් ශබ්ද සහ භෞතික සංකේත වැනි හැසිරීම් කාණ්ඩ කිහිපයක් තිබේ.

පැතිකඩ සම්පූර්ණ කිරීම සඳහා, ඔබ අවම වශයෙන් එක් ආකාරයක සන්නිවේදන හැසිරීමක් පරීක්ෂා කළ එම අයිතම සහ කාණ්ඩවලට අනුරූප වන කොටු අඳුරු කළ සහ නැගී එන හැසිරීම් අතර වෙනස හඳුනා ගැනීමට කුමන කේතය භාවිතා කළ යුතුද යන්න තීරණය කරන්න: ඔබට විවිධ වර්ණ වලින් අඳුරු කිරීම සිදු කල හැක.නැතහොත් ප්‍රගුණ කිරීම සඳහා තද පාටින් අඳුරු කිරීම කල හැකිය.. 01 සහ 02 ප්‍රශ්න සඳහා, ඔබ අවම වශයෙන් එක් හැසිරීමක් පරීක්ෂා කළ ඕනෑම ප්‍රශ්නයක් සඳහා පැතිකඩෙහි කොටුව අනුරූප අංකයට අදාළව අඳුරු කරන්න.

- උදාහරණයක් ලෙස, අ1 අයිතමයට කාණ්ඩ තුනක් ඇත (ශරීර චලනයන්, මුල් ශබ්ද සහ මුහුණේ ඉරියව්).
- ඔබ අ1 යටතේ කිසියම් හැසිරීම් පරීක්ෂා කර ඇත්නම්, ඔබ පැතිකඩෙහි අ.1 කොටුව (අපහසුතාවය ප්‍රකාශ කිරීම) පිරවිය යුතුය.
- කිසියම් හැසිරීමක් දරුවා දැනටමත් සිදු කරන හැසිරීමක් නම් (1ක් පමණක් වුවද), ඔබ එය අනුකෘතියේ දරුවා දැනටමත් සිදු කරන හැසිරීමක් ලෙස පිරවිය යුතුය.
- දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම් එකක් හෝ වැඩි ගණනක් සහ දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් නොමැති නම්, ඔබ එය දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම් ලෙස අනුකෘතියේ පිරවිය යුතුය.
- එසේ නොවුවහොත් එය හිස්ව තබනු ඇත. ඔබේ දරුවා එම මට්ටම් ඉක්මවා ගොස් ඇති නිසා ඔබ 1 හෝ 2 කොටස් මඟ හැරියේ නම්, ඔබට එම කොටු ද හිස්ව තැබිය හැකිය.

ඇ කොටසේ ප්‍රශ්න සඳහා තවත් කාණ්ඩ ඇති අතර ඒවා ඔබේ පොත් පිංචයේ සඳහන් කර ඇති සන්නිවේදන මට්ටම් කිහිපයක් දක්වා විහිදේ.

- උදාහරණයක් ලෙස, ඇ.1 ප්‍රශ්නයට කාණ්ඩ අටක් ඇත.
- ඉන් හතරක් අදියර 03 ලෙස නම් කර ඇති අතර අනෙක් අදියර 04, 05, 06 සහ 07 ලෙස නම් කර ඇත.

- ශරීර චලනයන්, මුල් ශබ්ද, මුහුණේ ඉරියව් හෝ සරල ඉඟි යටතේ ඔබ හැසිරීම් එකක් හෝ කිහිපයක් පරීක්ෂා කර බැලුවහොත්, ඔබ ඇ.1 තීරුවේ, (ප්‍රතික්ෂේප කිරීම) අදියර 03 ලෙස ලේබල් කර යටතේ ඇති කොටුව අඳුරු කල යුතුය.
- තවද ඔබ වියුක්ත සංකේත (කතා කිරීම, අතින් කරනු ලබන සංඥා හෝ බ්‍රේල් හෝ ලිඛිත වචන) යටතේ හැසිරීමක් පරීක්ෂා කර ඇත්නම්, ඔබ ඇ.1 තීරුවේ අදියර 04 ලෙස ලේබල් කරන ලද කොටුව අඳුරු කල යුතුය.

ඉහත විස්තර කර ඇති පරිදි දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම් සහ දරුවා දැනටමත් සිදු කරන හැසිරීම් අතර වෙනස හඳුනා ගැනීමට මතක තබා ගන්න.

### 2.වෙනත් අයෙකුගෙන් එය කිරීමට ඇසීම.

ඔබේ දරුවාගේ කථන භාෂා චිකිත්සකවරයා හෝ ගුරුවරයා මැට්‍රික්ස් හි වෘත්තීය අනුවාදය (මුල් ඇගයුම) භාවිතා කරන්නේ නම් (හෝ එසේ නොකල ද), ඔබ පිරවූ තොරතුරු ඔබ වෙනුවෙන් පැතිකඩට (profile) මාරු කරන ලෙස එම පුද්ගලයාගෙන් ඉල්ලා සිටිය හැකිය.

### 3.එය මාර්ගගතව (online) සිදු කිරීම.

දෙමාපිය අනුකෘතිය www.communicationmatrix.org වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය. ඔබට මෙම වෙබ් අඩවියට ගොස් ඔබේ පොත් පිංචයේ ඇති තොරතුරු අන්තර්ජාලය හරහා ආකෘති පත්‍ර වෙත මාරු කළ හැකිය. ඔබ තොරතුරු ඉදිරිපත් කළ පසු, ඔබට මුද්‍රණය කිරීම සඳහා පැතිකඩක් ( profile) ලැබේ. මෙය නොමිලේ ලබාදෙන සේවාවකි.

## සන්නිවේදන අරමුණු තීරණය කිරීම සඳහා සන්නිවේදන අනුකෘති (Communication Matrix) ප්‍රතිඵල භාවිතා කිරීම

ඔබේ දරුවාගේ වර්තමාන කුසලතාවන්ට අනුව සුදුසු සන්නිවේදන අරමුණු තීරණය කිරීමට දෙමාපියන්ට සහ අධ්‍යාපනඥයින්ට සන්නිවේදන අනුකෘති ප්‍රතිඵල උදව් විය හැකිය. ඔබට සාමාන්‍ය මැදිහත්වීමේ ඉලක්කයක් (ඉලක්කගත කළ යුතු සන්නිවේදන මට්ටම) මෙන්ම නිශ්චිත මැදිහත්වීමේ ඉලක්ක (ඉලක්කගත කළ යුතු නිශ්චිත සන්නිවේදන **හැසිරීම්** සහ **පණිවිඩ**) වර්ධනය කළ හැකිය.

පොදුවේ ගත් කල, ඊළඟ සන්නිවේදන මට්ටම කරා ගමන් කිරීමට , ඔහුගේ හෝ ඇයගේ වර්තමාන සන්නිවේදන මට්ටමේ දී දරුවෙකුට ඉඩ දිය යුතුය. මූලික වශයෙන් ගත යුතු පළමු තීරණය වන්නේ,

- වර්තමාන මට්ටමේ දී දරුවාගේ සන්නිවේදන හැකියාව ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කළ යුතුද (වර්තමාන සන්නිවේදන මට්ටමේ දරුවාට සන්නිවේදන හැසිරීම් හෝ පණිවිඩ ඉතා සුළු සංඛ්‍යාවක් පමණක් තිබේ නම් ඔබ එය කල යුතුය.)

**යන්න හෝ,**

- අලුත් ඉහළ සන්නිවේදන මට්ටමක සන්නිවේදන හැසිරීම් දරුවා තුල දියුණු කිරීමද, යන්නයි.

ඊළඟට ගත යුතු තීරණය වන්නේ,

- ඔබ දරුවාගේ දැනට පවතින සන්නිවේදන හැසිරීමක් දියුණු කරනවාද

**යන්න හෝ,**

- දරුවා දැනට භාවිතා නොකරන නව සන්නිවේදන හැසිරීමක් දියුණු කරනවාද, යන්නයි.

මෙම තීරණ දරුවාගේ රළු චාලක ක්‍රියා (උදා: ඇවිදීම,දිවීම වැනි) , සියුම් චාලක ක්‍රියා, ( උදා: ඇඟිලි තුඩු වලින් කුඩා දෙයක් ඇල්ලීම වැනි) වාචික හා සංවේදක (sensory) ක්‍රියාවන් සහ , දරුවාට අපහසු හෝ කළ නොහැකි සීමාවන් සැලකිල්ලට ගත යුතුය. යම් ආකාරයක සංකේත තේරුම් ගැනීමට නොහැකි කරවන දරුවාගේ බුද්ධි මට්ටමේ සීමාවන් (Cognitive limitations) ද ඔබ සලකා බැලිය යුතුය. අවසාන වශයෙන්, කුමන පණිවිඩ ඉලක්ක කළ යුතුද යන්න ඔබ හරියටම තීරණය කළ යුතුය. දරුවාගේ සන්නිවේදන කුසලතාවන්හි හිඩැස් ඇති තැන තීරණය කිරීමට පැතිකඩ (profile) වෙත යොමු විය යුතුය.දරුවාට සැබවින්ම ප්‍රකාශ කළ හැකි නව පණිවිඩ ඉලක්ක කල යුතුය.

*********

නම ____________________ දිනය ________/________ සම්පූර්ණ කරන ලද්දේ _

**සංකේත වර්ග**
අදියර 5,6 සහ 7 සඳහා විශේෂිත ආකාරයේ සංකේත භාවිතා කරයි.
(උදා: පිංතූර සංකේත, වස්තු සංකේත, අතින් කරන සංඥා, කථාව)

යතුර
[ ] දරුවා තුළ තවමත් දියුණු වෙමින් පවතින හැසිරීම.
[ ] දරුවා දැනටමත් සිදු කරන හැසිරීම.

| මට්ටම | විස්තරය | කොටු |
|---|---|---|
| I | දරුවා අරමුණකින් යුතුව හැසිරීමට පෙර අවධිය ශරීර චලන මූලික ශබ්ද මුහුණේ ඉරියව් | ඇ1 අපහසුතාවය ප්‍රකාශ කිරීම.<br>ඇ 2 ප්‍රකාශ කිරීම. 1<br>ඇ 3 අන් අය කෙරෙහි ඇති උනන්දුව ප්‍රකාශ කිරීම. 1 |
| II | දරුවා අරමුණකින් යුතුව හැසිරෙන අවධි. ශරීර චලන මූලික ශබ්ද මුහුණේ ඉරියව් පෙනෙන හැසිරීම. | ආ1 විරෝධය ප්‍රකාශ කිරීම.2<br>ආ2 ක්‍රියාවක් අඛණ්ඩව සිදු කිරීම. 2<br>ආ3 යම් දෙයක් තවත් ලබාගැනීම. 2<br>ආ4 අවධානය ලබාගැනීම. |
| III | සාම්ප්‍රදායික නොවන සන්නිවේදනය. ශරීර චලන මූලික ශබ්ද මුහුණේ ඉරියව් සරල අංග චලන | ඇ1 ප්‍රතික්ෂේප කිරීම.<br>ඇ2 යම් කිසි ක්‍රියාවක් නැවත නැවත ඉල්ලීම<br>ඇ3 අලුත් ක්‍රියාවක් ඉල්ලීම.<br>ඇ4 භාණ්ඩයක් තවත් ඉල්ලීම. 3<br>ඇ5 දේවල් අතරින් තේරීම. 3<br>ඇ6 අලුත් භාණ්ඩයක් ඉල්ලීම<br>ඇ8 අවධානය ඉල්ලීම 3<br>ඇ9 සෙනෙහස දැක්වීම. 3 |
| IV | සාම්ප්‍රදායික සන්නිවේදනය. සාම්ප්‍රදායික ඉඟි විශේෂිත ශබ්ද නැගීම. | ප්‍රතික්ෂේප කිරීම. 4<br>යම් ක්‍රියාවක් නැවත නැවත ඉල්ලීම.4<br>අලුත් ක්‍රියාවක් ඉල්ලීම. 4<br>භාණ්ඩයක් තවත් ඉල්ලීම 4<br>දේවල් අතරින් තේරීම. 4<br>අලුත් භාණ්ඩයක් ඉල්ලීම4<br>අවධානය ඉල්ලීම 4<br>සෙනෙහස දැක්වීම 4<br>ඇ 10 ආචාර කිරීම. 4<br>ඇ 11 දේවල් බෙදා ගැනීම 4<br>ඇ12 ඔබේ අවධානය යොමු...<br>ඇ 13 ආචාරශීලී වචන භාවිතය. 4<br>ඇ 14 ඔව්, නැ ප්‍රශ්නවලට පිළිතුරු...<br>ඇ 15 ප්‍රශ්න ඇසීම. 4 |
| V | භෞතික සංකේත වස්තු සංකේත පිංතූර සංකේත ඉඟි රහ දැක්වීම ශබ්ද අනුකරණය | ප්‍රතික්ෂේප කිරීම<br>යම් ක්‍රියාවක් නැවත නැවත ඉල්ලීම5<br>අලුත් ක්‍රියාවක් ඉල්ලීම. 5<br>භාණ්ඩයක් තවත් ඉල්ලීම. 5<br>දේවල් අතරින් තේරීම. 5<br>අලුත් භාණ්ඩයක් ඉල්ලීම. 5<br>ළඟ නොමැති භාණ්ඩයක් ඉල්ලීම.7<br>අවධානය ඉල්ලීම 5<br>සෙනෙහස දැක්වීම. 5<br>ආචාර කිරීම 5<br>දේවල් බෙදා ගැනීම.5<br>ඔබේ අවධානය යොමු කිරීම<br>ආචාරශීලී වචන භාවිතය 5<br>ඔව් නැ ප්‍රශ්න වලට පිළිතුරු දීම. 5<br>ප්‍රශ්න ඇසීම 5<br>ඇ 16 දේවල් හෝ මිනිසුන් නම්...<br>ඇ 17 අදහස් දැක්වීම 5 |
| VI | වියුක්ත සංකේත කතා කරන වචන අතින් කරන සංඥා ලියා ඇති වචන | ප්‍රතික්ෂේප කිරීම 6<br>යම් ක්‍රියාවක් නැවත නැවත ඉල්ලීම<br>අලුත් ක්‍රියාවක් ඉල්ලීම<br>භාණ්ඩයක් තවත් ඉල්ලීම6<br>දේවල් අතරින් එකක් තේරීම<br>අලුත් භාණ්ඩයක් ඉල්ලීම<br>ළඟ නොමැති භාණ්ඩයක් ඉල්ලීම<br>අවධානය ඉල්ලීම 6<br>සෙනෙහස දැක්වීම 6<br>ආචාර කිරීම.<br>දේවල් බෙදා ගැනීම.6<br>ඔබේ අවධානය යොමු කිරීම. 6<br>ආචාරශීලී වචන භාවිතය. 6<br>ඔව් නැ ප්‍රශ්න වලට පිළිතුරු දීම 6.<br>ප්‍රශ්න ඇසීම 6<br>දේවල් හෝ මිනිසුන් නම් කිරීම. 6<br>අදහස් දැක්වීම 6 |
| VII | භාශාව සංකේත 2ක් හෝ කිහිපයක් | ප්‍රතික්ෂේප කිරීම. 7<br>යම් ක්‍රියාවක් නැවත ඉල්ලීම 7<br>අලුත් ක්‍රියාවක් ඉල්ලීම.<br>භාණ්ඩයක් තවත් ඉල්ලීම 7<br>දේවල් අතරින් එකක් තේරීම<br>අලුත් භාණ්ඩයක් ඉල්ලීම 7<br>ළඟ නොමැති භාණ්ඩයක් ඉල්ලීම<br>අවධානය ඉල්ලීම 7<br>සෙනෙහස දැක්වීම 7<br>ආචාර කිරීම .7<br>දේවල් බෙදා ගැනීම. 7<br>ඔබේ අවධානය යොමු කිරීම. 7<br>ආචාරශීලී වචන භාවිතය 7<br>ඔව් නැ ප්‍රශ්න වලට පිළිතුරු දීම.7<br>ප්‍රශ්න ඇසීම.7<br>දේවල් හෝ මිනිසුන් නම් කිරීම.7<br>අදහස් දැක්වීම 7 |

| ලබාගැනීම | ප්‍රතික්ෂේප කිරීම. | සමාජීය | තොරතුරු |
|---|---|---|---|

**දෙමව්පියන් සඳහා වන සන්නිවේදන අනුකෘතිය**